---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජනවාරි 03 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 27 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඉකුත් වර්ෂය අවසානයට අයවිය යුතුව පැවති ඉකුත් වර්ෂයේ ණයගැතියන් යටතේ ගිණුම්ගත නොකළ ප්‍රාග්ධන ආධාර රු.6,038,533 ක් සමාලෝචිත වර්ෂය තුල ලැබීමේදී සමුච්චිත අරමුදල බැරකිරීම වෙනුවට වර්ෂයේ අය ශීර්ෂයන්ට බැර කිරීම නිසා වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පැවති රු.1,485,459 ක් වූ ගොඩනැගිලි 03 ක වටිනාකම සහ සතිපොල භූමි 04 ක වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබූ බැවින්, එදිනට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.1,485,459 බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයට ගෙවිය යුතු රු.25,318 ක් සහ පෙර වර්ෂවලට අදාලව ගෙවිය යුතු රු.699,279 ක් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබූ බැවින්, වර්ෂයේ වියදම රු.25,318 කින් අඩුවෙන් ද 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.724,597 කින් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2008 දෙසැම්බර් සිට 2009 නොවැම්බර් දකවා කාලයට අදාලව ලැබිය යුතු උසාවි දඩ රු.776,954 ක් 2012 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්**

2013 අප්‍රේල් 30 දින වන විට විගණන විමසුම් 15 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර, පිළිතුරු නොලත් විගණන විමසුම්වල කාල විශ්ලේෂණය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| මාස 03 සිට අවුරුදු 01 දක්වා | - 01 |
| අවුරුදු 01 සට අවුරුදු 02 දක්වා | - 14 |
| | 15 |

(ආ) **තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,013,140 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.687,861 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 436,698 ක් විය.

2.2. **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 521 | 1,069 | 184 |
| (ii) | බදු කුලී | 1,634 | 1,461 | 349 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 459 | 347 | - |
| (iv) | වෙනත් ආදායම් | 17,346 | 23,926 | 6,892 |

### 2.2.2 බදු කුලී

සභාව සතු කඩ කාමර 02 ක් බදුගෙන තිබූ බදුකරුවන් විසින් මාස 30 කට අධික කාලයක කුලී ගෙවීම් පැහැර හැර තිබුණු අතර, එම කඩ කාමර වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 ට පැවති හිඟය රු.156,737 ක් විය.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 362,516 |
| (ii) | මුද්දර ගාස්තු | 698,637 |

### 2.2.4 වෙනත් ආදායම්

(අ) සභාව විසින් ත්‍රීරෝද රථ ගාල් වලින් ගාස්තු අයකිරීමට අතුරු ව්‍යවස්ථා පනවා තිබූ නමුත් ත්‍රිරෝද රථ ගාල් 02 ක ගාල්කරනු ලබන ත්‍රීරෝද රථ 23 කින් ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ජංගම අලෙවි රථවලින් ගාස්තු අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර නොතිබීම නිසා සභාවට ලැබිය යුතුව තිබූ ආදායමක් අහිමිව තිබුණි.

2.3 **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

(අ) 2002 වර්ෂයේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ රු.529,000 ක් වැයකර ඩොලමයිට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල එම ව්‍යාපෘතිය ආරම්භ නොකර අත්හැර දැමීම නිසා 2003 වර්ෂයේ සිට 2013 අප්‍රේල් දක්වා නිෂ්ක්‍රියව පැවතුනි.

(ආ) යුධ හමුදා ක්‍රියාන්විත රාජකාරි සඳහා ගෙන ගොස් 2010 ඔක්තෝබර් 27 දින නැවත සභාවට භාර දෙන ලද කැබ් රථය ධාවනයට නුසුදුසු අබලන් තත්ත්වයෙන් සභා අංගනයේ ගාල්කර තිබුණි.

2.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන පිළිබඳව සලකා බැලීමකින් තොරව ප්‍රජා පාදක සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

2.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) අදාල ව්‍යාපෘතිය නිමවූ පසු සභාවට ලබාදීමේ පදනම මත 2008 වර්ෂයේ උපමාන පාදක ආධාර යටතේ මීගහකිවුල ජාතික සවිය ගම නැගුම මෙහෙයුම් කාර්යාලය වෙත ලබාදී තිබූ රු.301,600 ක් වටිනා වත්කම් එම ව්‍යාපෘතිය නිමවූ පසු සභාවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 203 රීතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ දේපල පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය